| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව | | |
|---|---|---|
| විෂය - චිත්‍ර විෂය | සතිය - 05<br>ශ්‍රේණිය - 6 | සැකසුම - උපුලී චතුරානි ධර්මසේන<br>මාවනැල්ල අධ්‍යාපන කලාපය |

ක්‍රියාකාරකම :- 4.1.1 ළමා පොත් පිටකවරයක් නිර්මාණය කරමු.

පොත් පිටකවර නිර්මාණය ග්‍රැෆික් සැලසුම් ගණයට අයත්ය.

**<u>පොත් පිටකවරයක මූලික ලක්ෂණ</u>**

- ආකර්ෂණීය වර්ණ භාවිතය
- ගැලපෙන නමක් (ආකර්ෂණීය අක්ෂර)
- කතෘ නාමය සඳහන් වේ.
- මුල් පිටුව, පසු පිටුව හා පොතේ ඝනකමක් තිබීම.
  පිටකවරයේ ඝනකම අදාළ වයස් මට්ටම අනුව වෙනස් වේ. එනම්, ළමා කතන්දර පොතක පිටු 04 කට පමණ සීමා වේ. එවිට පොතේ ඝනකම අඩු වේ.
- මිල

<u>නිර්මාණය කරන ආකාරය</u>

සීල් මුද්‍රණ ශිල්ප ක්‍රමය භාවිතය

- සමතල අච්චුවක් සකස් කර ගැනීම.
- පිටකවරයේ සැලසුම සහිත ඩ්‍රොවින් කඩදාසිය මත නිදහස් ලෙස වර්ණ කිහිපයක් ඝනව හෝ දියර ලෙස ආලේප කර වියළෙන්නට හරින්න.
- ආදර්ශ සටහනක් සකසා සකස් කර ගත් අච්චුවේ වර්ණ තවරා ගැලපෙන පරිදි මෝස්තරය මුද්‍රණය කර ගැනීම.
- කැපෙන මායින් හා නැමෙන මායින් කළු ඉරි වලින් ලකුණු කිරීම.

**අවශ්‍ය ද්‍රව්‍ය**

අර්ටාපල් / කුරුම්බැට්ටි / ස්වභාවික කොළ වර්ග / අත්ල හෝ වෙනත් ආදේශක ද්‍රව්‍ය, ඩ්‍රොවින් කඩදාසි, පේපර් කටර්, පින්සල් දිය සායම්

තෝරාගත් මුද්‍රිත ළමා පොත් පිටකවර ආදර්ශ කිහිපයක්

<u>පොත් පිට කවරයේ සැලසුම</u>




